13. 19 වන සියවසේ මුස්ලිම් සමාජයේ ප්‍රබෝධය ඉලක්ක කරගෙන සිද්දි ලෙබ්බෙ විද්වතාණන් සහ අයි. එල්. එම්. අසීස් යන අය විසින් පළ කළ පුවත්පත් පිළිවෙළින්,
(1) මුස්ලිම් පාතුකාවලන් සහ සමරසම් වේ. (2) මුස්ලිම් නේසන් හා දුලුඋල් හක් වේ.
(3) අල්-හසනාත් හා ඉස්ලාමීය ශිදනයි වේ. (4) මුස්ලිම් නේසන් සහ මුස්ලිම් පාතුකාවලන් වේ.
(5) දුලුඋල් හක් සහ සමරසම් වේ.

14. 'ඉහ්යා උලූමුද්දීන්' නම් ග්‍රන්ථයේ කර්තෘ වනුයේ,
(1) ඉමාම් බුහාරි (රහ්) ය. (2) ඉමාම් ගස්සාලි (රහ්) ය.
(3) ඉමාම් නවවි (රහ්) ය. (4) ඉමාම් ෂාෆිඊ (රහ්) ය.
(5) ඉමාම් රාෆිඊ (රහ්) ය.

15. 'තාවකාලික මහ්රම්' ලෙස සලකනු ලබන්නේ,
(1) පියාගේ සොහොයුරියයි. (2) බිරිඳගේ මවයි.
(3) මවගේ සොහොයුරියයි. (4) පුතාගේ බිරිඳයි.
(5) බිරිඳගේ සොහොයුරියයි.

16. අබුල් හසන් අෂ්අරි පිළිබඳ **වැරදි** මතය වනුයේ, ඔහු
(1) මුඃතසිලා සංවිධානයේ ආරම්භකයා ය.
(2) මුඃතසිලා සංවිධානයට විරුද්ධ අයෙකි.
(3) 'මහා පව් කළ අය කාෆිර් නොවේ' යන අදහස දරන්නා ය.
(4) 'අල්-කුර්ආන් මවන ලද්දකි' යන අදහස නොපිළිගත් අයෙකි.
(5) ඉමාම් අහ්මදු ඉබ්නු හන්බල්ගේ මත දරන්නෙකි.

17. පහත දී ඇති ඒවායින් කුඩා වර්ගයේ ෂිර්ක්වලින් අයත් වන්නේ මොනවා ද?
(1) මැතිරීම, හූනියම් කිරීම සහ සූර්ය නමස්කාරය වේ.
(2) ශාස්ත්‍ර බැලීම, වශී ගුරුකම් කිරීම සහ පිළිම වන්දනාව වේ.
(3) නිමිති බැලීම, මැතිරීම සහ වශී ගුරුකම් කිරීම වේ.
(4) හූනියම් කිරීම, අල්ලාහ් නොවන ඒවායේ නමින් බිලි දීම, පිළිම වන්දනාව වේ.
(5) නූල් බැඳීම, මැතිරීම සහ වශී ගුරුකම් කිරීම වේ.

18. මුජ්තහිද්වරු සතු ලක්ෂණයක් **නොවනුයේ**,
(1) මුස්ලිම් වීම ය.
(2) අල්-කුර්ආන් සහ සුන්නා සම්බන්ධයෙන් නිපුණතාව ලබා ගැනීම ය.
(3) විවිධ භාෂා කුසලතා ලබා තිබීම ය.
(4) සහබාවරුන්ගේත් තාබිඊන්වරුන්ගේත් ෆත්වා දැන ගැනීම ය.
(5) නිසි වයසට පත් මනා සිහිය ඇති අයකු වීම ය.

19. 'කෆාඅත්' යනු,
(1) විවාහ යෝජනාව ය. (2) මනාලයාගේ කැමැත්ත ය.
(3) කලත්‍රයා තේරීම ය. (4) නිකාහ් දේශනාව ය.
(5) ගැළපීම ය.

20. පහත සඳහන් ආගමික විද්වතුන් අතුරින් ශ්‍රී ලංකාවේ අරාබි-දෙමළ භාෂා වර්ධනයට දායක වූයේ,
(1) මාප්පිල්ලයි ආලිම් ය. (2) උමර් හස්රත් ය.
(3) අබ්දුල් හමීඩ් බක්රි ය. (4) මස්ඌද් ආලිම් ය.
(5) අබ්දුල් හමීඩ් නූරි ය.

21. මුස්ලිම් රාජ්‍යයක ජීවත් වූ අරාබි **නොවන** මුස්ලිම් ප්‍රජාව හඳුන්වනු ලැබුයේ කුමන නමින් ද?
(1) හර්බි (2) තිම්මි (3) මවාලි (4) මුෂ්රික් (5) මුඃමින්

22. නබි (සල්) වදාළ බවට තාබිඊවරයකු දන්වන හදීසය,
(1) මුන්කතිඃ ය. (2) මුඅල්ලක් ය. (3) මුල්තරබ් ය. (4) මුතල්ලස් ය. (5) මුර්සල් ය.

23. අල්-අස්හර් විශ්ව විද්‍යාලය පිහිටා ඇති රට,
(1) සිරියාව ය. (2) ලෙබනනය ය. (3) ඊජිප්තුව ය. (4) සවුදි අරාබිය ය. (5) ඉරාකය ය.

24. 'නිශ්ශබ්දතාව කැමත්තේ ලක්ෂණයකි' යන උපකල්පනය මත බිහි වූ ඉජ්මාව,
(1) සුකූති ය. (2) සරීහ් ය. (3) අක්සරිය්යා ය. (4) මුරක්කබ් ය. (5) කව්ලි ය.

25. 'අස්ලි'හි ස්වභාවයත් 'ෆරඋ'හි ස්වභාවයත් සමානව පවතින කියාස්,
(1) අල්-අද්නා ය. (2) අල්-අව්ලා ය. (3) අල්-මුසාවි ය. (4) අල්-ජලිය්යි ය. (5) අල්-හබි ය.

26. හිස ගසා දැමීමේ දඬුවම ලබන වරදකරු වනුයේ,
(1) සොරා ය. (2) වංචනිකයා ය. (3) බොරුකාරයා ය. (4) ඝාතකයා ය. (5) මං පහරන්නා ය.

27. ඉස්ලාම් අනුමත කර ඇති ආර්ථික කටයුතු අතුරින් 'අතමාරුවට දීම' යන්න දක්වන අරාබි වචනය වනුයේ,
(1) ඉආරා ය. (2) මුෂාරකා ය. (3) රිබා ය. (4) මුලාරබා ය. (5) කෆ්ෆාරා ය.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

28. සකාත් ලබා ගැනීමට සුදුසු කණ්ඩායම් අටෙන් 'ආමිල්' ලෙස හඳුන්වන්නේ,
(1) දුප්පතුන් ය.
(2) ණයකරුවන් ය.
(3) සකාත් රැස් කර බෙදා හරින කාර්යයේ යෙදෙන්නන් ය.
(4) මගීන් ය.
(5) ජිහාදයේ යෙදෙන්නන් ය.

29. ෆික්හ් ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ නම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) අහ්මද් (රහ්), සුෆ්රි (රහ්) සහ මාලික් (රහ්)
(2) ෂාෆිඊ (රහ්), නසඊ (රහ්) සහ අහ්මද් ඉබ්නු හන්බල් (රහ්)
(3) මාලික් (රහ්), අබූ හනීෆා (රහ්) සහ අබූ යූසුෆ් (රහ්)
(4) අව්සාඊ (රහ්), නවවි (රහ්) සහ ගස්සාලි (රහ්)
(5) මාලික් (රහ්), අබූ දාවූද් (රහ්) සහ මුස්ලිම් (රහ්)

30. නබිවරුන්ට තිබිය යුතු ගුණාංග වන්නේ
(1) කිත්බු, කියානත්, කිත්මාන් සහ බලාදත් ය.
(2) සිද්කුන්, කියානත්, බලාදත්, තබ්ලීක් ය.
(3) සම්උන්, බසීරුන්, මුරීදුන් සහ ආලිමුන් ය.
(4) සිද්කුන්, අමානත්, ෆතානත් සහ තබ්ලීක් ය.
(5) අජ්සුන්, බකමුන්, මයියිතුන් සහ අසම්මුන් ය.

31. පහත සඳහන් ප්‍රකාශ අතුරින් ඉමාම් මුස්ලිම් සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) එතුමාගේ නියම නම මුස්ලිම් වේ.
(2) ඔහු මදීනාවේ ඉපදුණේ ය.
(3) එතුමාගේ ග්‍රන්ථය 'සහීහයින්' නම් වේ.
(4) 'ෆත්හුල් බාරි'යනු එතුමාගේ ග්‍රන්ථයේ විවරණය වේ.
(5) එතුමා හිජ්රි 206 දි නයිසාපූර්හි දී අභාවයට පත් විය.

32. පළමුවන අකබා ගිවිසුමෙන් පසු දැවා කටයුතු සඳහා මදීනාවට යවනු ලැබූ නබි සහාබිවරයා වූයේ,
(1) මුස්අබ් (රලි) ය.
(2) අනස් (රලි) ය.
(3) අබූ හුරයිරා (රලි) ය.
(4) තල්හා (රලි) ය.
(5) අල්කමා (රලි) ය.

33. හජ් වන්දනා අවස්ථාවේ ජම්රාවල දී ගල් ගැසීම,
(1) ෆර්ල් ය.
(2) වාජිබ් ය.
(3) සුන්නත් ය.
(4) ජායිස් ය.
(5) මුස්තහබ් ය.

34. සමහර උරුමකරුවන් නිසා අන් සමහර උරුමකරුවන්ට කොටස් අහිමි වීම දක්වන වචනය,
(1) අල්-හජබ් වේ.
(2) හජබ් නුක්සාන් වේ.
(3) හජබ් හිර්මාන් වේ.
(4) සාකිත් වේ.
(5) මහ්ජූබ් වේ.

35. මිනිසා විසින් ඉටු කළ යුතු කිලාෆත්, ඉබාදත් සහ ඉමාරත් කාර්ය සමහරක් පහත දැක්වේ.
A - මූලික යුතුකම් ඉටු කිරීම
B - රටට විශ්වාසීව කටයුතු කිරීම
C - අන් ජන සමාජ සමග සුහදව ජීවත් වීම
D - පරිසරය දූෂණයෙන් තොරව සුරැකීම
E - ස්වාභාවික සම්පත් සුරැකීම
මෙයින් ඉමාරත් කටයුතු හා සම්බන්ධ වනුයේ,
(1) A හා B ය.
(2) B හා C ය.
(3) B හා D ය.
(4) C හා D ය.
(5) D හා E ය.

36. කුලෆාඋර් රාෂිදූන්වරු සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත.
A - 'යමාමා යුද්ධයෙන් පසු අල්-කුර්ආනය ගොනු කළ යුතු ය' යන අදහස ඉදිරිපත් කළේ ය.
B - 'බෛතුල් මාල්' හඳුන්වා දුන් තැනැත්තා ය.
C - උසාමාගේ නායකත්වය යටතේ ෂාම් දේශයට හමුදාව යැවූ පුද්ගලයා ය.
D - අල්-කුර්ආනය පිටපත් කර ඉස්ලාමීය අධිරාජ්‍යයේ විවිධ පෙදෙස්වලට යැවූ පුද්ගලයා ය.
E - 'අල්-ෆාරූක්' යන සුවිශේෂ නම ලැබූ තැනැත්තා ය.
F - ඉබ්නු මුල්ජිම් නම් යුදෙව් ඝාතකයා විසින් ඝාතනය කරනු ලැබූ පුද්ගලයා ය.
මෙයින් කලීෆා උමර් (රළි) සම්බන්ධ කරුණු වන්නේ,
(1) A, B හා E ය.
(2) A, B හා F ය.
(3) A, C හා E ය.
(4) C, D හා E ය.
(5) D, E හා F ය.

37. ෂරිආ නීතිය මගින් කලින් ස්ථිරව ඔප්පු කළ කරුණක් හෝ ප්‍රතික්ෂේප කළ කරුණක් දිගට ම ඒ අයුරින් ම තබා ගැනීම
(1) උර්ෆු ය.
(2) ෂරඋ මන්කබ්ලනා ය.
(3) ඉස්තිහ්සාන් ය.
(4) ඉස්තිස්හාබ් ය.
(5) කියාස් අද්නා ය.

38. දික්කසාද අවස්ථාවේ දී සැමියා බිරිඳට දිය යුතු යැයි ෂරිආ පවසන දීමනාව
(1) නෆකා ය.
(2) කිස්වා ය.
(3) මදාඋ ය.
(4) සකන් ය.
(5) සදකා ය.

● අංක 39 සිට 42 තෙක් ප්‍රශ්නවලට අදාළ ව **X** හා **Y** යටතේ දී ඇති තොරතුරු කිසියම් ආකාරයකින් එකිනෙකට සම්බන්ධතාවක් දක්වයි. ඒ අනුව **Y** තීරුවේ ඇති ඒවා, **X** තීරුවේ ඇති ඒවා සමග නිවැරදි අනුපිළිවෙළින් ගළපා ඇති වරණය තෝරන්න.

39.

| X | Y |
|---|---|
| (i) හුදුද් | A – අල්වකාලා |
| (ii) රහ්න් | B – මුෆස්සල් |
| (iii) ෂිර්කා | C – හසන් |
| (iv) මුජ්මල් | D – කිසස් |
| (v) සහීහ් | E – කුෆ්ර් |

(1) B C D E A (2) C D E A B (3) D A E B C (4) D E A B C (5) D E B C A

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

[හතරවැනි පිටුව බලන්න.

40.

| X | Y |
|---|---|
| (i) කිලාෆත් | A – මාලික් |
| (ii) දඃවත් | B – මදනි |
| (iii) මක්කි | C – මස්ලහා මුර්සලා |
| (iv) උර්ෆු | D – අල්-ජිහාද් ෆිල් ලිසාන් |
| (v) ෆික්හු | E – ඉමාරත් |

(1) A B C D E (2) B D C A E (3) D B C A E (4) E B C A D (5) E D B C A

41.

| X | Y |
|---|---|
| (i) රන් | A – සුන්නා |
| (ii) අව්රත් | B – ෆස්කු |
| (iii) වාජිබ් | C – සේද |
| (iv) කුල්උ | D – හිජාබ් |
| (v) රජ්ඊ | E – බායින් |

(1) C A B D E (2) C E A B D (3) C E A D B (4) C D A B E (5) D E C A B

42.

| X | Y |
|---|---|
| (i) ජාමිඋල් බයාන් | A – සෙයියද් කුතුබ් |
| (ii) තෆ්සීර් මනාර් | B – සමක්ෂරි |
| (iii) ෆි ලිලාලිල් කුර්-ආන් | C – සුයූති |
| (iv) අල්-කෂ්ෂාෆ් | D – ජරීර් අත්තබරි |
| (v) තෆ්සීර් ජලාලයින් | D – රෂීද් රිලා |

(1) A B C D E (2) B D C E A (3) C D E A B (4) D A E C B (5) D E A B C

- අංක **43** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙකක් බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2) , (3) , (4) , (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යෙදුම් යුගලය සහිත වරණය තෝරා, එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු යෙදුම | දෙවැනි යෙදුම |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 43. | මූලික වශයෙන් සියල්ල හලාල් ය. | අල්ලාහ් කැමැත්තේ නම්, ෂිර්ක් කිරීමට සමාව දෙයි. |
| 44. | හදීස්වලින් මුතවාතිර් වන හදීස් පිළිනොගත් ඒවා ය. | ලඊෆ් වන හදීස් ද නීති සම්පාදනයට යොදා ගත හැකි ය. |
| 45. | මුෂාරකා, මුලාරබා සහ මුරාබහා යනු ඉස්ලාම් අනුමත හවුල් වෙළඳ පිළිවෙත් ය. | පොලී ගනුදෙනු වෙළඳ ක්‍රමයක් විය හැකි ය. |
| 46. | ෆික්හ් ක්ෂේත්‍රයේ යෙදෙන උගතුන් හදීස් ක්ෂේත්‍රයේ නිපුණතාව ලබා තිබිය යුතු ය. | ඉමාම් මාලික් (රහ්), ඉමාම් ෂාෆිඊ (රහ්) ආදීන් හදීස් හා ෆික්හ් ක්ෂේත්‍රවල නිපුණතාව ලැබූ අය වූහ. |
| 47. | 'අල්-ජිහාද් ෆිල් මාල්' යනු දිවෙන් කරන සටන වේ. | 'අල්-ජිහාද් ෆින් නෆ්ස්' යනු ධනයෙන් කරන සටන වේ. |
| 48. | ගර්භිණී කාන්තාවන්ගේ ඉද්දා කාලය මාස හතරක් හා දින දහයක් වේ. | තලාක් කියන ලද කාන්තාවන්ගේ ඉද්දා කාලය මාස්ශුද්ධි තුනකි. |
| 49. | ජිස්යා බද්ද තිම්මිවරුන්ට ආරක්ෂාව සහතික කරයි. | වරාසත් දේපළවලින් කාෆිර් වූ පුතාටත් කොටස් දිය හැකි ය. |
| 50. | ශ්‍රී ලංකාව හා අරාබිය අතර සම්බන්ධය ඉස්ලාම් බිහි වීමට කලින් ඇති වූවකි. | ශ්‍රී ලංකාවේ ඉස්ලාම් වර්ධනය වීමට ඉන්දීය උලමාවරු දායකත්වය සපයා ඇත. |

* * *

Department of Examinations, Sri Lanka

AL/2017/44/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

ඉස්ලාම් II
இஸ்லாம் II
Islam II

44 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. පහත දැක්වෙන වචන යුගල අතර පවතින වෙනස දක්වන්න.
   (i) ඉලාහ් - රබ්බු
   (ii) කුෆ්ර් - රිද්දත්
   (iii) මුෂ්රික් - මුල්හිද්
   (iv) නුබුව්වත් - රිසාලත්

2. (i) ඉස්ලාමයේ විවාහය නියම කර ඇත්තේ ඇයි?
   (ii) විවාහයක ප්‍රධාන අංග දක්වන්න.
   (iii) දික්කසාදය වළක්වන ක්‍රම පහදා දෙන්න.
   (iv) ඉද්දාහ් අරමුණු පෙන්වා දෙන්න.

3. (i) 'අකීදා' යනු කුමක් ද?
   (ii) අහ්ලුස්සුන්නා අකීදා පිළිබඳව පැහැදිලි කරන්න.
   (iii) එකිනෙකට ප්‍රතිවිරුද්ධ අකීදා බිහි වීමට හේතු මොනවා ද?
   (iv) මුඃතසිලාවරුන්ගේ ප්‍රධාන මූලධර්ම මොනවා දැයි සඳහන් කරන්න.

## II කොටස

4. (i) ෆික්හ් ක්ෂේත්‍රයේ මතභේද ඇති වීමට හේතු වූ කරුණු පිළිබඳ විස්තර කරන්න.
   (ii) ෆික්හ් ක්ෂේත්‍රයට අදාළව ඉමාම් ෂාෆිඊ (රහ්) තුමාගේ දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

5. පහත සඳහන් ඒවා පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.
   (i) අස්බාබුන් නුසූල්
   (ii) ෂිර්ක්හි ආකාර
   (iii) ශ්‍රී ලංකාවේ කාදි උසාවි
   (iv) කියාමාව පිළිබඳ විශ්වාසය මිනිසා කෙරෙහි ඇති කරන බලපෑම

6. පහත සඳහන් ඒවා විස්තර කරන්න.
   (i) ඇඳුම් පැළඳුම් පිළිබඳ ඉස්ලාමීය නීති රීති
   (ii) මත්ද්‍රව්‍ය භාවිතය නිසා ඇති වන සමාජ පරිහානිය

7. (i) 'තස්කියතුන් නෆ්ස්' යන්න පැහැදිලි කරන්න.
   (ii) ආධ්‍යාත්මික වර්ධනය සඳහා වන ලක්ෂණ **හතරක්** දක්වා, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

8. (i) ලංකාවට අරාබිවරුන් පැමිණීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.
   (ii) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු රටේ සුභසිද්ධියට කර ඇති දායකත්වය අගයන්න.

* * *

Department of Examinations, Sri Lanka

